# 46

# සාම්ප්‍රදායික ජන ගී හා බැඳි සමාජ ක්‍රමය- මධ්‍යම පළාත ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්

*කේ. ඒ. ජී. එම්. ප්‍රේමසිරි* [1]
HS/2013/0738

කිසියම් රටක, ප්‍රදේශයක, යම් නිශ්චිත ජන කොටසක් සතු ගායන, වාදන ක්‍රම ඇතුළු සංගීත ක්‍රම ජන සංගිතය ලෙස සරල ව හැඳින්විය හැකි ය. අවිනිශ්චිත කර්තෘවරයෙකුගෙන් සමන්විත ව මුඛ පරම්පරාවෙන් පැවත ගෙන ආ ජන ගීයෙහි ඉතිහාසය දෙස අවධානය යොමු කරන කල්හි විජයාවතරණ සමයෙහි ද, ක්‍රි.ව.7, 8, 9, සියවස්වල ද, මහනුවර අවධියෙහි ද ජන ගී පිළිබඳ ඓතිහාසික මූලාශ්‍ර හමුවේ. මෙම පර්යේෂණය මගින් අධ්‍යයනය කෙරෙනුයේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතට අයත් සේ සැලකෙන ජන ගීයේ ඓතිහාසික සහ සමාජ පසුබිමයි. දේශීය ජන ගී වර්ගීකරණය කිරීමේදී ගැල්, පැල්, පාරු, පතල්, ආදී වශයෙන් වර්ගීකරණය කරනු ලබයි. එහිදී එක ම ජන ගීය ඇතැම් අවස්ථාවල ඉහත දක්වන ලද ජන ගී කිහිපයකම දක්නට ලැබීම ගැටලු සහගත ය. තවද විවිධ ග්‍රන්ථ පරිහරණය කිරීමේදි ඒ එක එකෙහි දක්නට ලැබෙන්නාවූ ජන ගීවල පබැඳුම වෙනස්වීම ද ගැටලු සහගතය. මධ්‍යම පළාතට ආවේණික වූ ගැමි ගායන ශෛලීන් අධ්‍යයනය කිරීමේදී ද මෙම තත්ත්වයෙන් බැහැර විය නොහැකි ය. ජන ගීතය මුඛ පරම්පරාවෙන් පැවත එන, කතෘ අවිනිශ්චිත වු ජනයාගේ වෙහෙස, මහන්සිය, වේදනාව විග්‍රහ කෙරෙන්නාවු, ජනයාගේ එදිනෙදා කර්යයන්හිදී භාවිත වු ගීත විශේෂයක් බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ මධ්‍යම පළාත, ජන ගී, සමාජ පසුබිම

1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) ප්‍රථම වසර *8889san@gmail.com*